# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,500 — 1965 සැප්තැම්බර් 8 වැනි බදාදා — 1965.9.8

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංක අයි. 108/56

### නියෝගය

(131 වෙනි අධිකාරය වන) 1957 අංක 14 හා 62 සහ 1962 අංක 4 දරණ කාර්මික ආරාවුල් (සංශෝධන) පනත් වලින් සංශෝධිත වූ කාර්මික ආරාවුල් පනතේ 22 වැනි වගන්තියෙන් අග්‍රාණ්ඩුකාරවරයා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, විලියම් ගොපල්ලව වන මම, 1965 මාර්තු 3 වැනි දින අංක 14,332 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ 1965 මාර්තු 2 වැනි දින දරණ මගේ නියෝගයෙන් පත් කරන ලද මණ්ඩලයේ අතිරේක සාමාජිකයින් වශයෙන් පහත සඳහන් අයව මෙයින් පත් කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

1965 සැප්තැම්බර් 4,
කොළඹ දී ය.

### උපලේඛනය

1. පෙඩ්රික් එම්මානුවෙල් අලස්
2. ජේම්ස් ඕර්ලන්ඩෝ ද සා බණ්ඩාරනායක
3. සිංහ බස්නායක
4. බ්‍රිටෝ ඇලෙක්සැන්ඩර් රොද්‍රිගෝ කන්දප්පා
5. මොහමඩ් රෂීඩ් අබ්දුල් කරීම්
6. නිහාල් රංජිත් මහින්ද දලුවත්ත
7. චාල්ස් වික්ටර් සයිමන් ද සිල්වා
8. ටිකිරි බණ්ඩා දිසානායක
9. රෝහණ නානායක්කාරවසම් හපුගල්ල
10. සිසිල් ජයතිලක
11. නාගනාදර් කුමාරසිංහම්
12. දයේන්ද්‍ර සේන විජේවර්ධන
13. අබ්දුල් කපූර් මොහමඩ් උවායිස්

9-544

---

ඉ. වා. හා වි/අමා. අංක ජේ. 258 (බීආර්)

අ. ආ. කා. අංක ඇල්. 91

1964 රේ අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතේ 6 (ඒ) සහ 6 (බී) වැනි වගන්තිවලින් සංශොධිත, (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19 වැනි වගන්තියේ, (1) සහ (2) වැනි උප වගන්තිවල විධිවිධාන යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමන්ගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පී. එච්. ඩබ්ලිව්. පීරිස් මහතා, සී. ඩී. ජයසුන්දර මහතා සහ ජී. වීරතුංග මහතා, 1965 සැප්තැම්බර් 15 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා එහි සඳහන් වන පරිදි ඇපැල් නඩු විසඳීම සම්බන්ධ සමාලොචන මණ්ඩලයේ තක්සේරු සාමාජිකයින් වශයෙන් පත් කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 සැප්තැම්බර 4 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

9-543

ඇල්.ඩී.—බී. 11/60

## වන්දනා ගමන් ආඥාපනත

(175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනතේ 2 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින්, අම්පාර දිස්ත්‍රික්කයේ දීඝවාපී විහාරස්ථානයේ සෑම වන්දනා ගමනකට අදාළවන ලෙස පනවනු ලැබූ නියෝග.

වී. දහනායක,
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 සැප්තැම්බර් 7 දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග ''1965 දීඝවාපී විහාරස්ථානයේ (වන්දනා ගමන්) නියෝග'' යනුවෙන් හැඳින්විය හැකි ය.

2. මේ නියෝගවල—

''ආණ්ඩුවේ දිසාපති'' යනුවෙන් අම්පාර පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති අදහස් වේ ;
''කඳවුරු පෙදෙස'' යනුවෙන් මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශය අදහස් වේ ;
''වෛද්‍ය නිලධාරී'' යනුවෙන් කඳවුරු පෙදෙස භාරව ක්‍රියා කරන වෛද්‍ය නිලධරයා අදහස් වේ.

3. ආණ්ඩුවේ දිසාපති විසින් ඒ ස්ථානයෙහි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමෙන් වෙන යම් කාර්යයක් සඳහා වෙන් කර ඇති ප්‍රදේශයෙහි කිසිවකු විසින් කඳවුරු නො බැඳිය යුතු ය.

4. කිසිවකු විසින්, කඳවුරු ප්‍රදේශය තුළ වෙන් කොට ඇති කොටසේ මිස, අන් තැනක මළපහ නොකළ යුතු ය.

5. ද්‍රව හෝ ඝණ කුණු කසළ දැමීමේ කාර්යය සඳහා සලසා ඇති කොටසේ හෝ භාජනයක හැර කඳවුරු ප්‍රදේශය තුළ කිසිවකු විසින් ඒවා නො දැමිය යුතු ය.

6. (1) ආණ්ඩුවේ දිසාපති විසින් ගව ගාලක් සඳහා විශේෂයෙන් වෙන් කරන ලද ස්ථානයක හෝ ඒ කාර්යය සඳහා වෙන් කර ඇති වෙනත් ස්ථානයක හැර කඳවුරු පෙදෙස තුළ හෝ ඊට ආසන්න ස්ථානයක කිසි ම කාර්යයක් සඳහා වත් යම් කෙනකු විසින් ගවයන් තබා නොගත යුතු ය.

(2) ගවයින් භාරව සිටින තැනැත්තා විසින් ගොම ඩුටු විගස ඒ සඳහා වෙන් කර ඇති ළඟම ස්ථානයට කඳවුරු ප්‍රදේශයෙන් ඉවත් කර විය යුතු අතර ගවයින් ලැගි තැන් හැමවිට ම පිරිසිදුවත් සනීපාරක්ෂාණුකූලවත් තබා ගත යුතු ය.

7. බෝවන රෝග හෝ ස්පර්ශයෙන් බෝවන රෝග වලින් පෙළෙන කිසිවකු කඳවුරු ප්‍රදේශයට ඇතුලු නො විය යුතු ය. එමෙන් ම කිසිවකු විසින් එවැනි යම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු කඳවුරු පෙදෙසට යන ඒම හෝ යන ඒමට උදව් හෝ අනුබල දීම නො කළ යුතු ය.

8. උත්සව සමයේ දී කඳවුරු ප්‍රදේශය තුළ වසංගත රෝගයක් හටගතහොත්, ආණ්ඩුවේ දිසාපති විසින්, කඳවුරු ප්‍රදේශයෙන් වහාම නික්මයන ලෙස වන්දනාකරුවන්ට නියම කිරීම සහ වන්දනාකරුවන් යායුතු මාර්ග සහ පාවිච්චි කළ යුතු රථ වාහන හෝ යායුතු ක්‍රමය නියම කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

9. කඳවුරු පෙදෙස තුළ යම් බෝවන රෝගයක් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයක් වැළඳී සිටින සෑම තැනැත්තකු ම සහ වෙනයම් තැනැත්තකු සමග, ඒ වෙනයම් තැනැත්තාට බෝවන හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයක් වැළඳී ඇති බැව් දැන ගෙන වාසය කරන සෑම තැනැත්තකු විසින් ම ඒ බව වෛද්‍ය නිලධරයා වෙත හෝ ඒ වෛද්‍ය නිලධරයා විසින් බලය පවරනු ලැබූ වෙන යම් තැනැත්තකු වෙත දැන්විය යුතු ය.

10. කඳවුරු පෙදෙස තුළ වූ යම් ජලාශයක් හෝ ලිඳක් නිශ්චිත ව සඳහන් යම් කාර්යයක් සඳහා වෙන් කොට, ඒබවට ඒ ස්ථානයේ දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති විට, එසේ වෙන් කරනු ලැබූ කාර්යය නො වන වෙන යම් කාර්යයක් සඳහා ඒ ජලාශය හෝ ලිඳ කිසිවකු විසින් පාවිච්චි නොකළ යුතු ය.

11. ආණ්ඩුවේ දිසාපති විසින්, නෑම සඳහා විශේෂයෙන් වෙන් කරන ලද ස්ථානයක හැර කඳවුරු පෙදෙස ඇතුළත වෙන යම් ස්ථානයක දිය නෑම කිසිවකු විසින් නොකළ යුතු ය.

12. වෛද්‍ය නිලධරයා විසින් හෝ ඒ වෛද්‍ය නිලධරයා විසින් බලය පවරනු ලැබූ වෙන තැනැත්තකු විසින් අවශ්‍යයයි සිතන්නේ නම් කඳවුරු ප්‍රදේශය තුළ ඇති කවර ළිඳකට වුවද ක්ලෝරින් යෙදිය හැකි ය.

13. ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බල පත්‍රයක් නොමැතිව, කිසි ම තැනැත්තකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ බේකරියක්, සිසිල් පාන නිෂ්පාදනාගාරයක්, තේ හෝ කෝපි කඩයක්, කෑම සපයන ස්ථානයක් හෝ ගාලක් පවත්වාගෙන යාම හෝ කිසි ම ආහාර ද්‍රව්‍යයක් විකිණීම සඳහා තැබීම හෝ නොකළ යුතු ය. වෛද්‍ය නිලධරයා හෝ ඒ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තකු විසින් කරන ලද නිර්දේශ පිට, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් ගාස්තුවක් අය නො කර ඒ බලපත්‍රය නිකුත් කළ යුතු ය.

14. (1) වෛද්‍ය නිලධරයා විසින් හෝ ඒ වෛද්‍ය නිලධරයා විසින් බලය පවරනු ලැබූ වෙනයම් තැනැත්තකු විසින්, ආහාරයට අයෝග්‍ය යයි නිගමනය කරන ලද ආහාර කිසි ම තැනැත්තකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ නො විකිණිය යුතු ය.

(2) (I) වන ඡේදයේ විධිවිධාන යටතේ අයෝග්‍යය යි නිගමනය කරන ලද එවැනි යම් ආහාර වර්ගයක් යම් පොලිස් නිලධරයකු හෝ වෛද්‍ය නිලධරයා විසින් අත් අඩංගුවට ගෙන විනාශ කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

15. කඳවුරු ප්‍රදේශය තුළ විකිණීම සඳහා ආහාර වර්ග හා බීම වර්ග තබා ගන්නා සෑම තැනැත්තකු විසින් ම—

(1) ඒ ආහාර හෝ බීමවර්ග සහ ඒවා සෑදීමට ගන්නා සියලු ම ද්‍රව්‍ය දූවිලිලන් හා මැස්සන්ගෙන් අපවිත්‍ර නො වන අයුරු වෛද්‍ය නිලධරයා විසින් අනුමත කරන ලද වීදුරු අල්මාරිවල හෝ ආවරණය කරන ලද භාජනවල බහා, නැතහොත් පිරිසිදු කඩදසි හෝ රෙදිවලින් ඔතා තැබිය යුතු ය ; එසේ ම,

(2) එම ව්‍යාපාර කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානය, ලී බඩු සහ උපකරණ, පිරිසිදුවත් සනීපාරක්ෂක තත්ත්වයෙනුත් තැබිය යුතු ය.

16. වීථි වශයෙන් පාවිච්චි කිරීම සඳහා හෝ වෙනයම් කාර්යයක් සඳහා වෙන් කරන ලද යම් ඉඩමක් අයුතු ලෙස ආක්‍රමණය කෙරෙන පරිදි කඳවුරු ප්‍රදේශය තුළ යම් මඩුවක් හෝ වෙළඳ සැලක් ඉදි කිරීම හෝ ගොඩනැගිල්ලක් විශාල කිරීම, ආණ්ඩුවේ දිසාපතිගේ පූර්ව අනුමැතිය නො මැතිව කිසි ම තැනැත්තකු විසින් නො කළ යුතු ය.

17. කඳවුරු ප්‍රදේශය ඇතුළත ආණ්ඩුවේ දිසාපති විසින් වෙන් කරන ලද කොටසක, නො වන යම් ස්ථානයක යම් වර්ගයක යම් වෙළෙඳ භාණ්ඩයක් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කිසි ම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

18. ආණ්ඩුවේ දිසාපතිගේ පූර්ව අනුමැතිය නො මැතිව කඳවුරු ප්‍රදේශය තුළ හෝ එහි මායිම්වල සිට සැතපුමක දුර ප්‍රමාණයක් ඇතුළත ගිණිකෙළි පැවැත්වීම හෝ තුවක්කු පත්තු කිරීම කිසි ම තැනැත්තකු විසින් නො කළ යුතු ය.

19. කඳවුරු ප්‍රදේශය තුළ කිසි ම තැනැත්තකු විසින් කිසි ම සතකු නො මැරිය යුතු ය.

### උපලේඛනය

#### දීඝවාපී විහාරස්ථානයේ කඳවුරු පෙදෙස

උතුරට : නවක්කොඩිවලඹඩෙයි ගමෙන් ද,
නැගෙනහිරට : නයිකාඩෙයි වඩිච්චාල් නොහොත් නවලාඩි වඩිච්චාල් ගමෙන් ද,
දකුණට : තිරායඹඩෙයි ගමෙන් හා වැව් ඉවුරෙන් ද,
බස්නාහිරට : නවක්කිඩිවල් ඹඩෙයි ගමෙන්ද,

මායිම් ව, අක්කරපත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඔලුවිල් ග්‍රාම සේවක කොට්ඨාශයෙහි පිහිටි දීඝවාපී විහාරස්ථානය අවට ප්‍රදේශය.

9—542

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි